සැ. යු.-2009.06.26 දින පළ කරන ලද අංක 1,608 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,609 - 2009 ජූලි මස 03 වැනි සිකුරාදා - 2009.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 880 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 881 |

*සැ. යු.-* (i) හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009 අප්‍රේල් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2009 අප්‍රේල් 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009 මැයි මස 7 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජූලි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජූනි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

877 - B 080027 —9,120 (2009/07)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,

# තනතුරු – ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල ක්වාසි තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පිරිමියකු වියයුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මවුලවී කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලීම් සහතිකය දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු විය යුතුය.

දැනට රජයේ සේවයේ නියුක්තකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයකු විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

ක්වාසිවරයෙකු, තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිව සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයෙකුට මසකට රුපියල් 6,000 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත්‍ර මගින් අයදුම්පත් 2009 අගෝස්තු මස 03 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

පී. ඩබ්ලිව්. ඩී. සී. ජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ,
ලේකම්.

2009 ජූනි මස 16 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | බදුල්ල | : | බදුල්ල අධිකරණ කලාපයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 02. | බලපිටිය හා ඇල්පිටිය | : | බලපිටිය හා ඇල්පිටිය අධිකරණ කලාපයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 03. | බේරුවල | : | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 04. | කොළඹ (නැගෙනහිර) | : | කොළඹ අධිකරණ කලාපයේ අළුත්කඩේ, ග්‍රෑන්ඩ්පාස්, මාලිගාවත්ත, ශාන්ත සෙබස්ටියන් පාර, නිව් බසාර්, තොටලඟ, කොච්චිකඩේ, කොටහේන, පාදුක්ක, බෝකුන්දර, මීගොඩ, ගොඩගම, පනාගොඩ, මාලබේ, උතුරු තලංගම, කොට්කාවත්ත හා බුත්ගමම යන ප්‍රදේශවල ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 05. | කොළඹ (උතුර) | : | කොළඹ අධිකරණ කලාපයේ කොටුව, පිටකොටුව, මරදාන, සුදුවැල්ල, බොරැල්ල, කුපියාවත්ත, දෙමටගොඩ, මාලිගාකන්ද, මාදම්පිටිය, මෝදර, මට්ටක්කුලිය, කොටා පාර, කොලොන්නාව, අංගොඩ හා වැල්ලම්පිටිය යන ප්‍රදේශ වල ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 06. | හාරිස්පත්තුව හා පූජාපිටිය | : | මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව හා පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 07. | හොරණ | : | හොරණ අධිකරණ කලාපයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 08. | කරයිවාහුර්පත්තු දකුණ (සායින්දමරුදූ) | : | අම්පාර දිස්ත්‍රික්කයේ සායින්දමරුදූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 09. | කෝරලයිපත්තු (වාලච්චේනයි) | : | මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලයිපත්තු නැගෙනහිර (ඔඩ්ඩමාවඩි හැර) ආදායම් කොට්ඨාසයේ (වාලච්චේනයි) ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |

10. මන්නාරම : මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම හා මාන්දයි ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

11. මාතර : මාතර අධිකරණ බල ප්‍රදේශය ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

12. මාවනැල්ල : මාවනැල්ල අධිකරණ බල ප්‍රදේශය ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

13. නුවරඑළිය : නුවරඑළිය අධිකරණ බල ප්‍රදේශය ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

14. සමන්තුරේ : අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරේ ප්‍රාදේශීය සභා අංක 01 හා 02, මල්කන්පිටි, නෙයිනාකාඩු, මල්වත්ත, නාවින්දවලි, අන්නමිලයි යන ප්‍රදේශවලින් සමන්විත සමන්තුරේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

15. තම්බලගමුව හා කන්තලේ : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තම්බලගමුව හා කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

16. ත්‍රිකුණාමලය : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරය, කඩවත් හා මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

17. උඩ, මැද හා පහතදුම්බර (උඩතලවින්න): මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර, මැද දුම්බර හා පහත දුම්බර ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

18. උඩුනුවර : මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

19. වව්නියාව : වව්නියාව අධිකරණ බල ප්‍රදේශය ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

07-111

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

**තක්සේරු දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු තනතුර***

තක්සේරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2009.07.17 දිනට හෝ ඉන් පෙර ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, මහ ලේකම් කාර්යාලය, කොළඹ 01 වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළ කොටසේ "ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු තනතුර" යන්න සඳහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ.

*සටහන :*

(i) මතු දැක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙල නොවූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පතක් තැපෑලේදී නැති වී යයි හෝ ප්‍රමාද වී යයි හෝ යන චෝදනාවන් සළකා බැලිය නොහැක. අවසන් දින කීපය තෙක් ඉල්ලුම්පත් එවීම පමා කරන අපේක්ෂකයන් ඒ පිළිබඳ වගකීම තමන් විසින්ම භාර ගත යුතුයි.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 ට අනුව, ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III/II ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුළත තමා සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

පත් වීමේ දින සිට වසර පහක් තුළ නියමිත අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

03. *වැටුප් හා දීමනා.*—2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) හි අංක MN-5-2006 A දරන වැටුප් බණ්ඩය (මාසික) (රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685) මෙම තනතුරට හිමිවේ. වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා එහි සංශෝධනවල සඳහන් විධිවිධානවලට අනුකූලවය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි දක්වා ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම් සමත් විය යුතුය. වැටුප් වර්ධක ගෙවීම කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීමට යටත් වනු ඇත.

04. *අවශ්‍ය සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම; සහ

(ii) විශිෂ්ට චරිතයකින් හෙබි මනා ඇස් පෙනීමෙන් යුත් සහ මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත තැනැත්තෙකු වීම; සහ

(iii) 2009.07.17 දිනට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, වයස අවුරුදු 35 ට වැඩි නොවීම. (ආයතන සංග්‍රහයේ ඇති අදාළ විධිවිධානයන්ට යටත්ව දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.); සහ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයක දේපළ පාලනය හා තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.*—නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන විවෘත තරග විභාගයට කැඳවනු ලැබේ. විභාගයේ දී ලබා ගන්නා කුසලතාවය අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(i) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළදී පවත්වනු ලැබේ. එම විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබාදෙන උපදෙස්වලට යටත්ව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

(ii) විවෘත තරග විභාගයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

(iii) පවත්නා පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම නොපුරවා සිටීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

(iv) විභාගය පැවැත්වීමට පෙර, පැවැත්වෙන අතරතුරේ හෝ පැවැත්වීමෙන් පසුව යන කවර අවස්ථාවකදී හෝ කිසියම් අයදුම්කරුවෙකු මෙම තනතුර සඳහා සුදුසුකම් නොලබන බව ඔප්පු වුවහොත් ඉහත කී ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

තවද, අයදුම්කරුවන් විසින් දැන දැනම අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව ඔහු/ඇය පත් කිරීමෙන් පසුව හෝ ඔප්පු වුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට සිදු වනු ඇත.

**විවෘත තරග විභාගය සඳහා විෂය නිර්දේශය :**

මෙය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

*I වන ප්‍රශ්න පත්‍රය :*

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 25 කට නොවැඩි දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයයන්ට අදාළ බහුවරණ ප්‍රශ්න පත්‍රයක් වේ.

*කාලය :* විනාඩි 30 කි.
සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

*II වන ප්‍රශ්න පත්‍රය*

සාමාන්‍යයෙන් මෙම ප්‍රශ්න පත්‍රයට පදනම වනුයේ දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාළ වන මාතෘකාවන් ය.

*කාලය :* විනාඩි 45 සිට පැය 1 දක්වා.
සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

06. දැනුම් දුන් විට අයදුම්කරුවන් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය. :

(i) උප්පැන්න සහතිකය (සැ. යු. : උපකෘත පාඨශාලා සඳහා වූ රෙගුලාසියේ කාර්ය පිණිස නිකුත් කෙරෙන උප්පැන්න සහතිකය භාර ගනු නොලැබේ.).
(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.
(iii) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන කටයුතු භාර අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.
(iv) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි සමත් උසස්ම විභාගයේ සහතික.

*සටහන :*

(i) කිසිදු ලියවිල්ලක් හෝ ලියකියවිලිවල පිටපත් හෝ ඉල්ලුම්පතට අමුණා නොඑවිය යුතුය.

(ii) ඉල්ලා සිටිවිට ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

07. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

08. ඉල්ලුම්පත් හා ඊට සම්බන්ධ වෙනත් යම් ලිපි වේ නම් ඒවා එවිය යුත්තේ ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, මහ ලේකම් කාර්යාලය, කොළඹ 01 වෙත මිස වෙන කිසිදු නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

2009 ජූනි මස 17 වැනි දින,
මහ ලේකම් කාර්යාලය,
කොළඹ 01.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු II තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2009*

සැ. යු. : ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළින් "තක්සේරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු අතර, ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, මහ ලේකම් කාර්යාලය, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. අයදුම්කරුගේ නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (උදා :SILVA, A.B.)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්).

02. පෞද්ගලික ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්).
(ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහාම දැන්විය යුතුය).
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී -1)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

04. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක -2)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

05. ජන වර්ගය : (සිංහල -1, දෙමළ -2, ඉ. දෙමළ -3, මුස්ලිම් - 4 වෙනත් -5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

06. ජාතික හැඳුනුම්පත් අංකය :

07. උපන් දිනය:

වර්ෂය : මාසය : දිනය :

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

08. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? යන්න සඳහන් කරන්න. (ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

09. පහත සඳහන් විෂයයන්ගෙන් සමත් උසස්ම පරීක්ෂණය :————.

1. සිංහල
2. දෙමළ
3. ඉංග්‍රීසි

10. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :

| *විභාගය/ උපාධිය* | *ක්‍රියාත්මක වන දිනය* | *විශ්වවිද්‍යාලය/ ආයතනය* | *විෂයයන්* |
|---|---|---|---|
| | | | |

11. වර්තමාන රැකියාව සහ ඉහත දී යම් තනතුරක් දැරුවේ නම් ඒ පිළිබඳ විස්තර :

| *තනතුර* | *සිට* | *දක්වා* | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|
| | | | |

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේ ද? (එසේනම් විස්තර දක්වන්න) :————.

13. ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද? :————.

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? :————.

15. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. එහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගත හොත් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගත හොත් මට කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරු රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .....................තමැති මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ..................... (අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ රාජ්‍ය සංස්ථාවේ) සේවයේ නියුක්ත බවත්, ඔහුට/ඇයට එරෙහිව විනය පරීක්ෂණ කිසිවක් නොමැති බවත්, ඔහු/ඇය .................. වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

ඔහු/ඇය ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු II තනතුරකට පත්කිරීම සඳහා තෝරාගත හොත් මෙම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවයේ මුදාහැරිය හැකිය.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

කාර්යාලයීය ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න).
දිනය :————.

07-82

---

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

උසස් තාක්ෂණ ආයතනය - කොළඹ 15

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවට (HNDE)**

**සිසුන් ඇතුළත් කිරීම - 2009/2010 අධ්‍යයන වර්ෂය**

යථෝක්ත පාඨමාලාව සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පූර්ණකාලීන තුන් අවුරුදු න්‍යායික හා හය මාසික වැඩබිම් පුහුණුව ඇතුළත් පාඨමාලාවක් වන අතර සිවිල්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු යන විශේෂිත ඉංජිනේරු ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය, ලන්ඩන් ඉංජිනේරු මණ්ඩලයේ CEI (ලන්ඩන්) විභාගයේ පළමු අදියරෙන් නිදහස් වීම සඳහා සුදුසුකමක් වන අතර එමගින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ප්‍රථම විභාගයෙන් නිදහස් වීම සඳහා ද එය සුදුසුකමක් වනු ඇත.

මේ හැරුණු විට දකුණු ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයේ (University of South Australia) සිවු අවුරුදු ඉංජිනේරු පාඨමාලාව (B. Sc.) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලා සහතිකයේ සුදුසුකම් පහත දැක්වෙන පරිදි ඇගයීමට ලක්වී ඇත :

1. යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා - වසර 02 ක නිදහස් කිරීමක් ද,
2. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා - වසර 02 ක නිදහස් කිරීමක් ද,
3. විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා - වසර 1 1/2 ක නිදහස් කිරීමක් ද සිදු කරයි.

මහා බ්‍රිතාන්‍යයේ ඇතැම් පිළිගත් විශ්වවිද්‍යාල උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා ලාභීන් හට ඔවුන්ගේ ඉංජිනේරු පාඨමාලාව එක් වසරකින් නිම කිරීම සඳහා IELTS විභාගයෙන් නිදහස්ව පහසුකම් සලසා ඇත. තව ද, මෙලෙස උපාධිය සාර්ථකව නිම කරන්නන් සඳහා මහා බ්‍රිතාන්‍යයේ වසර 02ක රැකියා බලපත්‍රය ද හිමිවනු ඇත.

මෙම පාඨමාලාවේ විෂය නිර්දේශ, භෞතික හා මානව සම්පත් ඕස්ට්‍රියා හා නෙදර්ලන්ත රාජ්‍යයන්ගේ අනුග්‍රහය යටතේ සංවර්ධනය වේ.

පාඨමාලාව සඳහා බඳවා ගැනීමට සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :

01. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකා පුරවැසියකු වීම.

02. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් විසින් 2008 වර්ෂයේ හෝ ඊට පෙර පවත්වන ලද නව නිර්දේශයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය හදාරන ලද අයදුම්කරුවන් අවම වශයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනෙන් එක්වර සමත්ව තිබිය යුතුය.

03. අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 23 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගී වීමට නිදහස් විය යුතු අතර සති අන්තයේදී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගී වීමට හැකි විය යුතුය.

අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරගත යුතුය. ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේදී අ. පො. ස. (උ. පෙළ) ලකුණුවල සාමාන්‍ය හෝ Z-score සැලකිල්ලට ගනු ලැබේ.

අයදුම්පත්‍ර ගාස්තුව රු. 250.00 කි. එම ගාස්තු මුදල මහජන බැංකුව, හයිඩ් පාර්ක් කෝනර් ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් 025100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ජංගම ගිණුමට බැරකර ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතට ඇමිණිය යුතුය.

නියමිත අයුරින් සකස්කළ අයදුම්පත්‍ර අධ්‍යක්ෂිකා උසස් තාක්ෂණ ආයතනය, අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15, යන ලිපිනයට 2009.07.24 දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. "උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය 2009/2010" යන්න ලියුම් කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි සටහන් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක, අනුබද්ධිත විශ්ව විද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක. අධ්‍යාපන විද්‍යා පීඨයක/ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයෙකු එකම කාලය තුළදී වෙනත් ඉහත දැක්වූ රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවක් හදාරන බව හෙළිදරවු වුවහොත් ඇයගේ/ඔහුගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බව ද සැලකිය යුතුය. ශ්‍රී ලංකා උසස්

තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ලියාපදිංචි සිසුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ වන ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක ලියාපදිංචිය අහිමි බව ද සැලකිය යුතුය.

මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු අංශයට 2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව කරුණාවෙන් සලකන්න.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
අංක 18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය*

**උසස් තාක්ෂණ ආයතනය - මට්ටක්කුලිය 2009/2010 අධ්‍යයන වර්ෂය**

*උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි) පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :

02. මුලකුරු වලින් කියවෙන නම :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. උපන් දිනය :

05. ස්ත්‍රී/පුරුෂ භාවය :

06. ස්ථිර ලිපිනය (පහත කොටුවෙහි ලියන්න) :

07. පරිපාලන දිස්ත්‍රික්කය :

08. වඩාත් කැමති ඉංජිනේරු ක්ෂේත්‍රයන් පිළිවෙලින් :

| | |
|---|---|
| පළමු තේරීම | |
| දෙවැනි තේරීම | |
| තෙවන තේරීම | |

09. ඉංග්‍රීසි විෂය පිළිබඳ අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් ලත් ප්‍රතිඵල :

| *වර්ෂය* | *විභාගය* | *විභාග අංකය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

10. ඔබගේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ හොඳම ප්‍රතිඵල (2008 හෝ ඊට පෙර) :

| *වර්ෂය* | *විභාග අංකය* | *මාධ්‍යය* |
|---|---|---|
| | | |

| *විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. සංයුක්ත ගණිතය | |
| 2. භෞතික විද්‍යාව | |
| 3. රසායන විද්‍යාව | |
| 4. සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| Z/score | |

| *අවස්ථාව* | *පළමුවන* | | *දෙවන* | | *තුන්වන* | |
|---|---|---|---|---|---|---|

මම වෙනත් රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන්නේ නැතිබව මෙයින් ප්‍රකාශ කර සිටිමි. වෙනත් රාජ්‍ය ආයතනයක එකම කාලය තුළදී වෙනත් පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන බව හෙළිදරව් වුවහොත් මාගේ ලියාපදිංචි අවලංගු වන බව දනිමි. මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රු. 250 මුදල් ගෙවූ බවට බැංකු කුවිතාන්සිය අමුණන්න)

07-160

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | රු. | ශ. |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව'-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යාංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

*මාසය* — *පළ කිරීමේ දිනය* — *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*

**2009**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | 2009.07.03 | සිකුරාදා | 2009.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.10 | සිකුරාදා | 2009.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.17 | සිකුරාදා | 2009.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.24 | සිකුරාදා | 2009.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.31 | සිකුරාදා | 2009.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2009.08.07 | සිකුරාදා | 2009.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.14 | සිකුරාදා | 2009.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.21 | සිකුරාදා | 2009.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.28 | සිකුරාදා | 2009.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2009.09.03 | බ්‍රහස්පතින්දා | 2009.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.09.11 | සිකුරාදා | 2009.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.09.18 | සිකුරාදා | 2009.09.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.09.25 | සිකුරාදා | 2009.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.